සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් කොවිඩ්-19 වාර්තාකරණය සඳහා හඳුන්වා දී ඇති නිර්දේශ මාලාවේ දැක්වෙන එක් නිර්දේශයක් වන්නේ, "වෛරසය ආසාදිත පුද්ගලයින් රෝගීන් මිස අනෙක් අයට රෝගය පතුරුවන පුද්ගලයින් ලෙස හැඳින්වීමෙන් වළකින්න" යන්නයි. කෙසේ නමුත් ඇතැම් මාධ්‍ය තවමත් මෙම නිර්දේශයන්ට අනුගත නොවෙමින් කටයුතු කරනා අතර, ඊට උදාහරණ ලෙසින් ඔක්තෝබර් 19 අරුණ පුවත්පතේ දැක්වෙන "කටුනායක සේවකයා ගම්පොළ වනසයි", "එක කතක් නිසා බෝගස්වැව 100ක් නිරෝධායනයට" වැනි සිරස්තල පෙන්වා දිය හැක.

කොවිඩ්-19 වැළදීම කිසිසේත්ම යම් පුද්ගලයෙකුගේ වරදක් නොවේ. එසේ නම්, මෙවන් සිරස්තලයන් ඔස්සේ වෛරසයේ පැතිරීම යම් යම් පුද්ගලයින්ගේ වරදක් ලෙසින් චිත්‍රණය කිරීම කෙතරම් ආචාර ධාර්මිකද? කොවිඩ්-19 වසංගතය මර්දනය සඳහා කටයුතු කරමින් සිටින මේ මොහොතේදී, කොවිඩ්-19 ආසාදිතයන් සහ නිරෝධායනය කර සිටින්නන් සම්බන්ධයෙන් සමාජ කොන් කිරීමක් සහ ගර්හාවක් ඇතිවීමත්, ඒ ඔස්සේ කොවිඩ්-19 මර්දන කටයුතු වලට පවා යම් ආකාරයකින් බාධා එල්ලවීමත් මෙවන් වාර්තාකරණයන් ඔස්සේ ඇතිවිය හැකි අතුරු ප්‍රතිඵල නොවන්නේද? එසේම කොවිඩ්-19 වාර්තාකරණයේදී අනුකූල විය යුතු නිර්දේශයන් පවා නොතකා කටයුතු කිරීම මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවේද?

එසේම අවසන් වශයෙන් දැක්විය යුතු වන්නේ, කොවිඩ්-19 වාර්තාකරණයේදී මාධ්‍ය මගින් වගකීම් සහගත සහ ආචාර ධාර්මික මාධ්‍ය හැසිරීමක් පවත්වා ගැනීමේ වැදගත්කම සම්බන්ධයෙන් ඔක්තෝබර් 12 අරුණ පුවත්පතේ කතුවැකිය (shorturl.at/juSUY)තුළ පවා සඳහන් වී ඇති බවයි.

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #TV #NewsPapers #Coronavirus #Aruna**